## 4.1.1 නිර්දිෂ්ඨ ජනකවි වල පසුබිම් විස්තර කරමු.

(ටීකා සීපද, නමස්කාර ගාථා)

පහත සඳහන් ගායනා ඇසුරින් පිළිතුරු සපයන්න.

- ගද්‍ය පද්‍ය කොටස් ඇතුළත් ගායනා විශේෂය නම් කරන්න.
- හාස්‍ය රසය මෙන්ම ව්‍යංගාර්ථය ඇතුලත් ගායනා වර්ගය නම් කරන්න.
- අනාසානාත්මක ලක්ෂණ පමණක් ඇතුලත් ගායනය සඳහන් කරන්න.
- ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්තිය දක්වීම සඳහා සුදුසු ගායනය නම් කරන්න.
- ටීකා සී පද හඬනගා ගායනා කරන්න.
- නමස්කාර ගාථාවන් හා ටීකා සීපද අතර වෙනස හඳුනා ගන්න.
- මෙම කවි ගායනා කටපාඩම් කරන්න.
- අන්තර්ජාල පහසුකම් ඇත්නම් මෙම කව ගායනා පරිශීලනය කරන්න.

### නමස්කාර ගාථා

ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්ති පූර්වක ව කෙරෙන ගායන විශේෂයකි. බොහෝ සෙයින් රචනා වී ඇත්තේ පාලි භාෂාවෙනි. මේවා විලම්බ ලයෙන් ගායනය කරන හෙයින් මනා සේ භක්තිය, ගෞරවය, සංයමය යනාදි ගුණාංග වර්ධනය වේ. සිංහල බෞද්ධ ජනයා සෑම සුබ කටයුත්තක්ම නමස්කාර ගායනයකින් ආරම්භ කිරීම සාම්ප්‍රදායික ලක්ෂණයක් වී ඇත. එමෙන් ම අනාසාත්මකව ගායනය කිරීම මෙහි විශේෂ ලක්ෂණයකි.

01. සම්මා සම්බුද්ධ ඤාණේන - සම්මා සම්බුද්ධ දේසනා
සම්මා සම්බුද්ධ ලෝකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ

02. මෙරුජ විරාජිත සමං විය බුද්ධ රාජං
සිරි දන්ත සාගර සමං විය ධම්ම රාජං
සප්තකුට පබ්බත සමං විය සංඝ රාජං
සිරි බුද්ධ ධම්ම ගුණ සංඝ වරං නමාමි

ඉහත නමස්කාර ගාථාවෙහි දෙවන පාදයේ සිරි දන්ත සහ තුන්වෙනි පාදයෙහි සප්තකුඨ යන්න නිවැරදිය. ගායන ව්‍යවහාරයේදී ශ්‍රී දන්ත හා සත්කුල යනුවෙන් භාවිත කෙරේ.

## ටීකා සීපද

01. හෙමින් හෙමින් ............
තව ද ................ ඌරන්ට, ගෝනුන්ට, මුවන්ට, සාවුන්ට වෙඩි තියන්න
වල්පාරක් දිගේ කිට්ටුකරගෙන යන්නා වාගේ..........................
හෙමින් හෙමින් මම ගේකට යන කලට.....................
එකෙක් ඇවිත්.............
තවද .................. අත්තා, මුත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තා, සෝලියා, පාඬියා කාලේ මහා උස් කණාටු පොල් ගහකින් ගෙඩි පනහක් හැටක්.
සිඳහෙළන්නා වාගේ
එකෙක් ඇවිත් ..................දුන්නයි මගේ .................. පිට මැදට
තව ද .................. නැන්දා මාමාගේ ගෙදර ගොස්
හොඳ හොද්දක් බතක් මාළුවක් පින්නක් කෑවා වාගේ
එගුටි කකා .................. මම පිටවී යන කලට ..................
මම්ම මටම ..................
තවද .................. නැන්දා මාමා ආච්චි ආතා හූරා නෑනා කෙනෙක් සමඟ
සන්තෝස වේලාවකදී
කොක් හඬලා සිනා සෙන්නා වාගේ ..................
මම්ම මට ම ඉළ ඇට නැත හිනාවට ..................

02. උන් තැන අටයි ..................
උන් තැන අටයි තරිකිට දොද් දොං තා
උන් තැන අටයි තරිකිට දොද් දොං තා
උන් තැන අටයි තරිකිට දොද් දොං තා
තම් තම්දන තන දම්දන තනත්තනානා තම්දන
ඉහළ වෙලේ යන නෑනෝ පහළ වෙලේ යන නෑනෝ
ඉහළ වෙලේ ගොන් බානයි - පහළ වෙලේ තුන් බානයි
අල්ලපියෝ........................ අල්ලපියෝ ............................
තම්දන තම් දාන තානෙනා ............................
උන් තැන අටයි සිටිතැන නවයයි පාද..............

සැකසුම : එම්.ඩබ්.ඩී.එස්.එම්.කාන්තිමාලා
නැටුම්(ගුරු උපදේශක)